# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1994/32 - 2016 නොවැම්බර් මස 22 වැනි අඟහරුවාදා - 2016.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළ, වනාතමුල්ල කොට්ඨාසයේ දෙමටගොඩ පිහිටි මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති කොළඹ මහ නගර සභාව සතු එළු ඝාතකාගාරය නැමැති ඉඩම, අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 නොවැම්බර් මස 18 වැනි දින,
17 හා 18 වන මහල්,
''සුහුරු පාය'' සුහුතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 30 දරන වනාතමුල්ල කොට්ඨාසයේ, දෙමටගොඩ, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ පිහිටි, ලියාපදිංචි බලයලත් මිනින්දෝරු ටී. ආර්. ද සොයිසා විසින් පිළියෙල කරන ලද 2012.07.30 දිනැති අංක 33/2012 දරන සැලැස්මේ කැබලි අංක 01 ලෙස සවිස්තරව සඳහන් කර ඇත්තාවූ පහත සඳහන් මායිම් ඇතුළත පිහිටි ප්‍රමාණයෙන් අක්කර 02, රූඩ් 01, පර්චස් 3.77 ක් වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පෞද්ගලික ඉඩම ; |
| *නැගෙනහිරට* | : | දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ වරි. අංක ජී 247, 243 දරන ඉඩම් ; |
| *දකුණට* | : | මවුන්ට් ප්ලසන්ට් පාරේ වරි. අංක 4 සිට 28 දක්වා ස්ථාන ; |
| *බටහිරට* | : | මුස්ලිම් සුසාන භූමිය. |

12 - 331


1A - G 24610 — 09 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*